"තරුණියගේ බැංකු කාඩ් පතට සුද්දයක් දීලා" යන සිරස්තලයෙන් යුතුව, අරුණ පුවත්පතේ (ජූලි 19, 2022) පළ වී තිබූ පුවතකි. එහි සඳහන්ව තිබුණේ, ඇඟලුම් ආයතනයක සේවය කරන තරුණියකගේ බැංකු කාඩ් පත සොරාගත් අයෙකු එය භාවිත කොට සුපිරි වෙළඳසලකින් රුපියල් පහළොස් දහසක භාණ්ඩ රැගෙන ගොස් ඇති බවත්, ඒ පිළිබඳව පොලිසියට පැමිණිලි කර ඇති බවත් වේ. මෙම පුවත් වාර්තාව සමගින් කාටූනයක් ද දැක්වෙන අතර, එහි, කාන්තාවක් සහ පොලිස් නිලධාරියෙකු චිත්‍රණය කොට තිබේ.

1) මෙම කාටූනය තුළ එම කාන්තාව අඟ පසඟ හුවා දැක්වෙන පරිදි චිත්‍රණය කොට ඇති ආකාරය පිළිබඳ ඔබේ අදහස කුමක්ද? එය ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කාන්තාවන්ව කොන් කිරීමක්, ඒකාකෘතික කිරීමක් (stereotyping) සහ අගතියට පැමිණවීමක් නොවන්නේ ද?

2) මෙම කාටූනය ඉදිරිපත් කොට තිබෙන්නේම මෙම පුවත භාවාතිශය ආකාරයකින් නිරූපණය කිරීමට යැයි ඔබ සිතන්නේ ද?

ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කාන්තාවන් කොන් කිරීමෙන් වළකිමු!